අම්පාර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 29 - 2023

---

1. විගණන මතය

1.1 අම්පාර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 29 ක 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 2023 වර්ෂයට අදාළව අම්පාර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 29 ට අදාළව විගණන වාර්තා නිකුත් කර තිබූ අතර එම කාරක සභා 29 සඳහාම තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබූ අතර ඒ සඳහා හේතු වී තිබූ ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ඇතුළත්ව ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ලාහුගල හා පාලමුණ ගොවිජන සේවා කාරක සභා විසින් මූල්‍ය ප්‍රකාශනවල අඩංගු විය යුතු සංරචකයක් වන ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය සකස් කර මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.	2024 වර්ෂයේ සිට එම ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය සකස් කර ඉදිරිපත් කරන බව කාරුණිකව දන්වා සිටිමි.	සියලුම සංරචක ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණ	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දෙහිඅත්තකණ්ඩිය ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය තුළ සමාලෝචිත කාල පරිච්ඡේදය සඳහා වූ අතිරික්තය රු.10,591,246 ක් දක්වා නොතිබුණි.	ඉදිරියේදී අතිරික්තය ස්කන්ධ වෙනස් වීමේ ප්‍රකාශයට සටහන් කරමි.	මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකසා ඉදිරිපත් කළ යුතුය.
(ආ)	මඩානගම හා පල්ලන්ඔය ගොවිජන සේවා කාරක සභාවල සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතු පොලී රු.542,976 ක් හා ස්ථාවර තැන්පතු ශේෂය රු.200,311 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.	ඉදිරි වර්ෂයේ දී නිවැරදි කරමි.	සමාලෝචිත වර්ෂයට අදාළ ලැබීම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය තුළ දැක්විය යුතුය.

(ඇ)	මායාදුන්න ගොවිජන සේවා කාරක සභාවේ බඩ ඉරිඟු සඳහා යොදන යූරියා පොහොර ආරම්භක ශේෂය රු.2,878,500 ක් සහ SSP පොහොර අවසන් ශේෂය රු.96,100 ක් පොහොර ගිණුමේ සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා නොතිබුණි.	බඩ ඉරිගු පොහොර අවසන් ශේෂයක් නොවූ බැවින් එය සඳහන් කර නොමැත. SSP පොහොර මිටි 31 ක් වර්ෂය අවසානයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ සඳහන් කර නොමැත්තේ එය විකුණා මුදල් ගෙවීමේ පදනම යටතේ පෞද්ගලික ආයතනයකින් ලබාගෙන ඇති නිසාය.	පොහොර තොගයේ ආරම්භක හා අවසන් ශේෂය පොහොර ගිණුම් තුළ දැක්විය යුතුය.
(ඈ)	ගොවිජන සේවා කාරක සභා 06 කට අදාළව සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට යූරියා, MOP හා TSP පොහොර තොග වටිනාකම් පිළිවෙලින් රු.3,474,859 ක්, රු.6,097,033 ක් හා රු.59,280 ක් මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි.	2024 වර්ෂයේ නිවැරදි කරමි.	පොහොර තොග අවසන් ශේෂය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඉ)	හිඟුරාණ හා පදියතලාව ගොවිජන සේවා කාරක සභාවල සමාලෝචිත වර්ෂයේ යූරියා පොහොර අවසාන තොග වටිනාකම් රු.469,064 ක් මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි.	2024 වර්ෂයේ නිවැරදි කරමි.	- එම -
(ඊ)	පල්ලන්ඔය ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචිත වර්ෂයේ යූරියා හා MOP විකුණුම් සඳහා වෙළෙඳ ගිණුම් සකස්කර නොතිබුණු අතර ඊට අදාළ විකුණුම් ආදායම් හා බෑමේ කුලී පිළිවෙලින් රු.20,854,620 ක් හා රු.235,410 ක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය තුළ දක්වා නොතිබුණි.	ඉදිරි වර්ෂයේ දී නිවැරදි කරමි.	වෙළෙඳ ගිණුම තුළ හෝ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය තුළ අදාළ ගනුදෙනු දැක්විය යුතුය.
(උ)	පල්ලන්ඔය ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචිත වර්ෂයේ යූරියා හා MOP ගැනුම් වියදම් රු.51,141,836 ක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය තුළ දක්වා නොතිබුණි.	ඉදිරි වර්ෂයේ දී නිවැරදි කරමි.	අදාල වියදම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය තුළ දැක්විය යුතුය.
(ඌ)	පදියතලාව හා ඉරක්කාමම් ගොවිජන සේවා කාරක සභාවල සමාලෝචිත වර්ෂයේ යූරියා පොහොර විකුණුම් වටිනාකම යූරියා විකුණුම් ගිණුමේ රු.12,029,524 ක් වැඩියෙන් දක්වා තිබුණි.	2024.01.01 වර්ෂයේ ආරම්භක සමුච්චිත අරමුදලින් අඩු කිරිමට එකඟ වෙමි.	වටිනාකම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(එ)	පදියතලාව ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචිත වර්ෂයේ යූරියා හා MOP විකුණුම් ආදායම රු.4,964,078 ක් හා අදාළ පොහොර ආයතන වෙනුවෙන් ගෙවන ලද රු.10,994,439 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා නොතිබුණි.	ඉදිරි වර්ෂයේ සිට වාර්ෂික වාර්තාවන් සකස් කිරිමේ දී එම ගිණුම් අදාළ ගිණුමට ගිණුම් ගත කරමින් වාර්ෂික වාර්තා	ආදායම් හා වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.

		සකස් කිරීමට එකඟ වෙමි.	
(ඒ)	අක්කරපත්තුව නැගෙනහිර හා අක්කරපත්තුව බටහිර ගොවිජන සේවා කාරක සභාවල සමාලෝචිත වර්ෂයේ MOP විකුණුම් වටිනාකම රු.479,139 ක් වෙළෙඳ ගිණුම තුළ වැඩියෙන් දක්වා තිබුණි.	ඉදිරි වර්ෂයේදී නිවැරදි කරමි.	වටිනාකම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඔ)	ලාහුගල ගොවිජන සේවා කාරක සභාව විසින් සමාලෝචිත වර්ෂයට අදාළව MOP පොහොර කිලෝග්‍රෑම් 5,000 ක් මිලදීගැනීමේ වටිනාකම වන රු.900,000 ක් වෙළෙඳ ගිණුමේ දක්වා නොතිබුණි.	එම මිලදී ගන්නා ලද එම්.ඕ.පී. කිලෝග්‍රෑම් 5000 ක් 2023/24 මහ කන්නය තුළ බෙදාහැරීම සඳහා ගෙන්වන ලද පොහොර වේ.	වටිනාකම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඕ)	පානම ගොවිජන සේවා කාරක සභාව විසින් සමාලෝචිත වර්ෂයේ MOP පොහොර වෙනුවෙන් ගෙවිය යුතු රු.1,151,364 ක් හා යූරියා පොහොර වෙනුවෙන් ගෙවිය යුතු රු.122,884 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.	විකුණා මුදල් ගෙවීමේ පදනම මත සහනාධාර පොහොර අලෙවි කළ බැවින් 2023.12.31 දිනට විකුණා ඇති මුදල් වටිනාකම පමණක් ගෙවිය යුතු ලෙස දක්වන ලද අතර ඉතිරි පොහොර ප්‍රමාණය විකුණා නොමැති බැවින් එම වටිනාකම ගෙවිය යුතු ලෙස සටහන් නොකරන ලදී.	නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ක)	හිඟුරාණ හා වවලකඩේ ගොවිජන සේවා කාරක සභාවල කාබනික ජෛව දියර පොහොර ලීටර් 615 ක රු.312,967 ක් වූ වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ දක්වා නොතිබුණි.	ඉදිරි වර්ෂයේ දී නිවැරදි කරමි.	අවසන් තොග නිවරදිව ගිණුම්ගත කළ යුතුය.
(ග)	ගොවිජන සේවා කාරක සභා 11 ක් වෙත ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හා අනෙකුත් ආයතන විසින් ලබා දී තිබුණු ස්ථාවර වත්කම් 336 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.	2024 වර්ෂයේ නිවැරදි කරමි.	තක්සේරු වටිනාකම් ලබා ගනිමින් ගිණුම්ගත කිරීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය.
(ච)	ලාහුගල ගොවිජන සේවා කාරක සභාව විසින් සමාලෝචිත වර්ෂයේ ගොවි බැංකු ණය යටතේ ගොවීන් වෙත නිකුත් කර තිබූ රු.243,000 ක් වටිනා ස්ප්‍රේ මැෂින් 10 ක් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි.	සමාලෝචිත වර්ෂයේ ගොවි බැංකුව සඳහා මිලදී ගත් ස්ප්‍රේ මැෂින් 10 ක් ස්ථාවර වත්කම වලට වැරදීමකින් ඇතුළත් වී ඇති අතර එම මැෂින් 10 ස්ථාවර වත්කම් වලින් ඉවත් කිරීම සඳහා කටයුතු	කමිටුවලට අදාළ නොවන වත්කම් ගිණුම්ගත නොකළ යුතුය.

		කරන බව කාරුණිකව දන්වා සිටිමි.	
(ට)	පොතුවිල් ගොවිජන සේවා කාරක සභාව විසින් වැව අලුත්වැඩියා කිරීම වෙනුවෙන් ලැබිය යුතු රු.320,000 ක් ගිණුම්ගත කර නොතිබුණි.	ඉදිරි වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි.	වර්ෂයට අදාළව ලැබිය යුතු සම්පූර්ණ වටිනාකම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඩ)	ගොවිජන සේවා කාරක සභා 05 කට අදාළව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ ලැබිය යුතු අක්කර බදු රු.967,531 ක් අඩුවෙන් දක්වා තිබුණි.	2024 වර්ෂය තුළ දී එම වරද නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.	ලැබිය යුතු මුළු අක්කර බදු මුදල නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ත)	සම්මන්තුර ගොවිජන සේවා කාරක සභාව විසින් සමාලෝචිත වර්ෂයේ ඉඩම් ගොඩ කිරීම වෙනුවෙන් ලැබුණු රු.855,000 ක වටිනාකමින් ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙත ගෙවිය යුතු 40% ක වටිනාකම වන රු.342,000 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ දක්වා නොතිබුණි.	ඉදිරි වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි.	ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙත ගෙවිය යුතු වටිනාකම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ද)	නින්දවූර් ගොවිජන සේවා කාරක සභාව විසින් පාලමුණ පිහිටි කෘෂිකර්ම විද්‍යාලයට 2017 වර්ෂයේ දී ලබාදුන් ට්‍රැක්ටරය, ටේලරය, Nine Tine ටේලරය, වතුර මෝටර් 04 සහ අඩි 40 වතුර බට 04 ක වටිනාකම් ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.	ඉදිරි වර්ෂයේ දී ගොවිජන සේවා නියෝජ්‍ය කොමසාරිස්ගේ අනුමැතිය ලබාගෙන එම වටිනාකම් ගිණුම්වලින් ඉවත් කිරීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරමි.	පාලමුණ කෘෂිකර්ම විද්‍යාලයට ලබාදුන් අයිතමවල වටිනාකම් විධිමත් පරිදි ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය.
(න)	උහන ගොවිජන සේවා කාරක සභාව වටා වැට ඉදිකිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් ගොවිජන සේවා කාරක සභාවේ අරමුදලින් ගෙවා තිබූ රු.410,971 ක මුදල ප්‍රාග්ධනිත කර නොතිබුණු අතර ගෙවිය යුතු අත රඳවුම් මුදල රු.41,097 ක් ද ගිණුම්ගත කර නොතිබුණි.	ගොවිජන සේවා කාරක සභාවේ වැට ඉදිකිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් ගොවිජන සේවා කාරක සභාවෙන් ගෙවිය යුතු රඳවුම් මුදල වන රු.41,097 ක මුදල ගිණුම් ගත නොකිරීම වරදක් බවත් ලබන වර්ෂයේ ගිණුම් වාර්තාවේදී නිවැරදි කරන බව දන්වා සිටිමි.	සභාවේ අරමුදලින් ගෙවා තිබූ මුදල ප්‍රාග්ධනිත කර ගෙවිය යුතු අත රඳවුම් මුදල නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.

(ප)	ගොවිජන සේවා කාරක සභා 10 කට අයත් ඉඩම්වල අයිතිය ගොවිජන සේවා කාරක සභා වෙත පවරාගෙන ගිණුම්ගත කර නොතිබුණි.	ඉදිරියේ දී පවරාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කරමි.	අයිතිය පවරාගෙන ගිණුම්ගත කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය.

1.3.3 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

	විෂයය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පදියතලාව ගොවිජන සේවා කාරක සභාවට අදාළව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සඳහන්ව තිබූ එකතු වටිනාකම සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සටහන් විය යුතු නිවැරදි එකතු වටිනාකම අතර රු.7,027,368 ක නොසැසඳීමක් පැවතුණි.	පැරණි ශේෂ වේ. මේ පිළිබඳ ලිඛිත සාක්ෂි නොමැත. වාර්ෂික වාර්තා වල පමණක් ඉදිරියට එන ශේෂයන්ය.	නොසැසඳීම්වලට අදාළ හේතුන් සොයාබලා කඩිනමින් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	පල්ලන්ඔය ගොවිජන සේවා කාරක සභාවට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් අයිතම 06 ක මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම හා අනුරූපී වාර්තා අනුව වටිනාකම අතර රු.939,578 ක නොසැසඳීමක් පැවතුණි.	සාක්ෂි නොමැති බැවින් එම ශේෂ කපා හැරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී.	මෙම ශේෂ නිරවුල් කිරීමට හෝ විධිමත් පරිදි කටයුතු කර කපා හැරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඇ)	පොතුවිල් ගොවිජන සේවා කාරක සභාව විසින් ස්ථාවර තැන්පතු ගිණුමේ ශේෂය රු.8,076,827 ක් ලෙස දක්වා තිබුණු අතර බැංකුව විසින් යොමුකර ඇති ශේෂ සනාථන ලිපිය අනුව වටිනාකම රු.6,251,438 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.1,825,389 ක නොසැසඳීමක් පැවතුණි.	පිළිතුරු සපයා නොමැත.	මෙම ශේෂ පිළිබඳව පරීක්ෂා කර නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

1.3.4 අවිනිශ්චිත ගිණුම්

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ගොවිජන සේවා කාරක සභා 03කට අදාළ මූල්‍ය ප්‍රකාශනයන්හි 2018 හා 2021 වර්ෂවල සිට ඉදිරියට එන රු.1,077,844 ක අවිනිශ්චිත ගිණුම් ශේෂ 03 ක් නිවැරදි කිරීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2024 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි.	අවිනිශ්චිත ගිණුමේ අදාළ ගනුදෙනු හඳුනාගෙන නිවැරදි කළ යුතුය.

1.3.5 විගණන සඳහා ලිඛිත සාක්ෂි නොවීම

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ගොවිජන සේවා කාරක සභා 25ක අදාළ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු.166,529,914 ක වත්කම් හා වගකීම් ශේෂ පරීක්ෂා කිරීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි හා ශේෂ සනාථ කිරීම් නොමැති වීම නිසා විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය / සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.	පෙර වර්ෂ ගණනාවක සිට පැවත එන වත්කම් හා වගකීම් ගිණුම් අයිතම සඳහා විගණනය වෙත ඉදිරිපත් කිරීම සඳහා මධ්‍යස්ථානය සතුව සාක්ෂි හා තොරතුරු සොයා ගත නොහැකි බව දන්වා සිටින අතර, එම ශේෂ නිරවුල් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බවත් 2024 වර්ෂයේ දී එම ශේෂ ගිණුම් වාර්තාවේ නිවැරදි කිරීමට අපේක්ෂා කරන බව දන්වා සිටිමි.	අදාළ වත්කම් හා වගකීම් ගිණුම් ශේෂ තහවුරු කරගැනීම සඳහා අවශ්‍ය සාක්ෂි හා තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතුය.

1.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත			
(i)	32 හා 33 වගන්ති	අඩ්ඩාලච්චේන ගොවිජන සේවා බල ප්‍රදේශයේ අනවසරයෙන් ගොඩකරන ලද කුඹුරු ඉඩම් අක්කර 32 ක් අතරින් නැවත වගා කිරීමට අධිකරණ නියෝග ලබා දී තිබූ අක්කර 16 ක ප්‍රමාණය වගා කිරීමට කටයුතු කර නොතිබුණි.	2024 වර්ෂයේ දී අදාළ ඉඩම් වගා නොකළ ගොවීන් වෙත නැවත නඩු පැවරීමට කටයුතු කරමි.	එම කුඹුරු ඉඩම් අක්කර 16ක ප්‍රමාණය වගා කිරීමට අවශ්‍ය කඩිනම් පියවර ගත යුතුය.
(ii)	53 (1) වගන්තිය	ගොවිජන සේවා කාරක සභා 15 කට 2020 සිට 2022 දක්වා කුඹුරු ඉඩම් නාම ලේඛන සංශෝධනය සඳහා අයදුම්පත් 3,336 ක් ලැබී තිබුණ ද සංශෝධන කටයුතු සිදුකර ඇත්තේ අයදුම්පත් 1,149 ක් පමණි.	ඉදිරියේදී සංශෝධනය කිරීමට කටයුතු කරමි.	පනතේ විධිවිධාන ප්‍රකාරව අවශ්‍ය සංශෝධන කඩිනමින් සිදුකළ යුතුය.
(iii)	55 (1) වගන්තිය	පල්ලන්ඔය ගොවිජන සේවා බල ප්‍රදේශය ඇතුළත කෘෂිකාර්මික ඉඩම්වලට	පිළිතුරු සපයා නොමැත.	පනත ප්‍රකාරව අදාළ උපලේඛන කොමසාරිස්

		අදාළ පළමු උපලේඛනය කොමසාරිස් ජනරාල් විසින් සහතික කර නොතිබුණි.		ජනරාල් විසින් සහතික කළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි			
(i)	මු.රෙ. 110	ගොවිජන සේවා කාරක සභා 18 කට අදාළව මුදල් රෙගුලාසි ප්‍රකාරව හානි හා පාඩු ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.	හානි හා පාඩු ලේඛනයක් පවත්වාගෙන යාමට එකඟ වෙමි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ii)	මු.රෙ. 138	පල්ලන්ඔය ගොවිජන සේවා කාරක සභාවේ රු.123,091 ක් වටිනා වවුචර් පත් 12 ක් සඳහා ගොවිජන සේවා කාරක සභාවේ විධායක ලේකම්ගේ සහතික කිරීම් රහිතව ගෙවීම් කර තිබුණි.	පිළිතුරු සපයා නොමැත.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(iii)	මු.රෙ. 139	නාමල්තලාව හා පල්ලන්ඔය ගොවිජන සේවා කාරක සභාවල රු.337,239 ක් වටිනා වවුචර් පත් 11 කට අදාළව චෙක්පත් හෝ මුදල් භාරගත් පුද්ගලයින් විසින් චෙක්පත් හෝ මුදල් භාරගත් බවට අත්සන් තබා නොතිබුණි.	පිළිතුරු සපයා නොමැත.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(iv)	මු.රෙ. 316	රජයේ මුදල් සහ මූල්‍ය වටිනාකම් දැක්වෙන පත්‍රිකා සහ පෝරම භාවිතා කරන ආයතන විසින් එම මුදල් හෝ පත්‍රිකා සුරක්ෂිතව සේප්පුවක හෝ ආරක්ෂක පෙට්ටියක හෝ ආරක්ෂක කාමරයක තැන්පත් කොට තැබිය යුතු වුවත්, මහඔය හා ලාහුගල ගොවි බැංකු විසින් එසේ කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී සේප්පුවක හෝ ආරක්ෂිත පෙට්ටියක මුදල් හා මූල්‍ය පත්‍රිකා තැම්පත් කර තැබීමට කටයුතු කරමි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.

(v)	මු.රෙ. 395 (අ)	මායාදුන්න ගොවිජන සේවා කාරක සභාව විසින් 2023 දෙසැම්බර් 31 දිනට බැංකු ගිණුමක් සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශය සකස් කර නොතිබුණි.	2023 දෙසැම්බර් 31 දිනට 2162724 දරන කමිටු ගිණුම සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශය සකස් කර ඇත.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(vi)	මු.රෙ. 396 (ඈ)	ගොවිජන සේවා කාරක සභා 04 ක් විසින් නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා බැංකුවට ඉදිරිපත් නොකළ වසර 02 කට වැඩි කාලයක් ඉක්ම වූ රු.656,487 ක් වටිනා චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	මෙම චෙක්පත සමබන්ධයෙන් ඉදිරියේදී මුදල් රෙගුලාසි වලට අනුකූලව කටයුතු කරන බව කාරුණිකව දන්වමි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(vii)	මු.රෙ. 452	ගොවිජන සේවා කාරක සභා 04 ක් මුදල් රෙගුලාසි ප්‍රකාරව විගණන විමසුම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.	ඉදිරියේදී නිවැරදි ආකාරයට විගණන විමසුම් ලේඛනයක් සකස් කර පවත්වාගෙන යාමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(viii)	මු.රෙ. 502 (2)	ගොවිජන සේවා කාරක සභා 13 කට අදාළව මුදල් රෙගුලාසි ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.	ස්ථාවර වත්කම් ලේඛනයක් සකස් කර පවත්වාගෙන යාමට ඉදිරියේදී කටයුතු කරන බව කාරුණිකව දන්වමි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඈ)	ගොවිජන සංවර්ධන කොමසාරිස් චක්‍රලේඛ හා ලිපි			
(i)	1981 ඔක්තෝම්බර් 16 දිනැති අංක 107 දරන චක්‍රලේඛය			
	30 (2) ඡේදය	ගොවිජන සේවා කාරක සභා 06 කට අදාළව වත්කම් හා ණය ශේෂ සනාථ කිරීම සඳහා ණයකරුවන්ගෙන් හා ණය හිමියන්ගෙන් තහවුරු කිරීම් සහතික ලබාගත යුතු වුවද, එම තහවුරු කිරීම් සහතික	ඉදිරියේදී ලබා ගැනීමට කටයුතු කරමි.	ණයගැති හා ණයහිමි ශේෂ සනාථ කිරීම් ලබාගත යුතුය.

		ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.		
(ii)	2020 ජුනි 25 දිනැති හා අංක 08/2020 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් චක්‍රලේඛය	ගොවිජන සේවා කාරක සභා 04 කට අදාළ නිලධාරීන් 08 දෙනෙකු විසින් ඇප තැන්පත් තබා නොතිබුණි.	අදාළ නිලධාරීන් සඳහා ඉදිරියේ දී ඇප තැන්පතු මුදල් තැබීමට කටයුතු කරමි.	ඇප තැන්පත් තැබීමට කටයුතු කළ යුතුය.
(ඈ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006			
	2.4 වගන්තිය	ගොවිජන සේවා කාරක සභා 10 ක් විසින් මිලදීගන්නා ලද රු.4,929,796 ක් වටිනා උපකරණ සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා සකස්කර නොතිබුණි.	2024 වර්ෂයේ නිවැරදි කරමි.	සියලු ප්‍රසම්පාදන කටයුතු ප්‍රසම්පාදන මාර්ගෝප-දේශය අනුව සිදුකළ යුතුය.
(ඉ)	2014 අගෝස්තු 22 දිනැති අංක 07/2014 (107 සංශෝධන iii) දරන චක්‍රලේඛය	මහඔය ගොවිජන සේවා කාරක සභාවේ දෛනිකව අත රඳවා ගත හැකි උපරිම මුදල රු.10,000 ක් වුවත් එයට පටහැනිව 2023 වර්ෂයේ ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා කාලය තුළ අවස්ථා 46 කදී රු.10,172 සිට රු.442,768 දක්වා පරාසයක මුදල් අත රඳවාගෙන තිබුණි.	මධ්‍යස්ථාන කළමණාකරන සහකාර නිලධාරි මහත්මිය මධ්‍යස්ථාන දෙකක කටයුතු කරන නිසා, මධ්‍යස්ථානයේ නොමැති සෑම දිනකම මුදල් බැංකු ගත කිරීමට නොහැකි වී ඇත. විශාල ගොවීන් ප්‍රමාණයක් පොහොර මිලදී ගැනීමට පැමිණීම මෙම ගැටලුවට හේතු වී ඇත.	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඊ)	ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 2023 මැයි 16 දිනැති 7/7/කු.ඉ.ලේ.ප්‍රති/2023 දරන ලිපිය	මහඔය හා දෙහිඅත්තකණ්ඩිය ගොවිජන සේවා කාරක සභාවල 2023 මැයි 31 දින වන විට Geo Goviya වැඩසටහන අවසන් කළ	ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති නිසා Geo Goviya වැඩසටහන නියමිත දිනට අවසන් කර ගැනීමට	නියමිත දිනට වැඩසටහන අවසන් නොකිරීම සම්බන්ධයෙන් පරීක්ෂා කර හෝ වැඩසටහන

යුතු වුවත් ගොවීන් 12,572 දෙනෙකු ලියාපදිංචි කර (PLR) නොතිබුණු අතර ඉඩම්වල පිහිටීම අක්ෂාංශ හා දේශාංශ ක්‍රමාංකණය සහිතව මැනුම් කිරීම් (KML) 14,237 ක් මැනුම් කර නොතිබුණි.	නොහැකි විය.	කඩිනම් කිරීම සඳහා ක්‍රමවේද හඳුන්වා දිය යුතු බව.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

අම්පාර දිස්ත්‍රික්කයට අයත් ගොවිජන සේවා කාරක සභා 29කට අදාළව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.60,486,043 ක ලාභයක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.25,639,124 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.34,846,919 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ගොවිජන සේවා කාරක සභාවන්හි ස්ථාවර තැන්පතු පොලී ආදායම ඉහළ යාමත් අක්කර බදු ආදායම හා අනෙක් ආදායම් ඉහළ යාමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 අනාර්ථික ගනුදෙනු

විගණන නිරීක්ෂණ	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ගොවිජන සේවා කාරක සභා 06කට අදාළ 2020 වර්ෂයේ දී රු.964,948 ක් වියදම් කරමින් නිෂ්පාදනය කර තිබූ කොම්පෝස්ට් පොහොර තොගයක් ගොවීන් වෙත අලෙවි කිරීමකින් තොරව කාරක සභා භූමි තුළ ගොඩගසා තිබුණි.	ඉදිරියේ දී විකිණීමට කටයුතු කරමි.	කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා දරන ලද වියදම හෝ ආවරණය වන පරිදි විකිණීමට කටයුතු කළ යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණ	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු අම්පාර දිස්ත්‍රික් කාර්යාලය විසින් 2008, 2010 හා 2012 කාල සීමාව තුළ වාරික ගෙවීමේ පදනම මත ගොවිජන සේවා කාරක සභා 08 ක් වෙත ලබා දී ඇති අත්ට්‍රැක්ටර් 71 ක් සඳහා 2023 දෙසැම්බර් 31 වන දින වන විට රු.9,342,034 ක මුදලක් තවදුරටත් නිරවුල් කළ යුතුව පැවතුණි.	ඉදිරියේ දී අය කර ගැනීමට හා ගෙවීම් පැහැර හරින අය හට නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි.	හිඟ වාරික මුදල් අයකර ගැනීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය.
(ආ)	ගොවිජන සේවා කාරක සභා 27 කට අදාළව වර්ෂ 03 සිට වර්ෂ 23 ක කාලපරිච්ඡේදයක් තුළ විවිධ පාර්ශවයන්ගෙන් ලැබිය යුතුව පවතින	මෙම ලැබිය යුතු ශේෂයන් අයකර ගැනීමට හෝ කපා හැරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස දිස්ත්‍රික්	අදාළ මුදල් අයකර ගැනීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය.

	රු.179,635,528 ක වටිනාකම අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	කාර්යාලය - අම්පාර, හා ප්‍රධාන කාර්යාලය දැනුවත් කර ඇත.	
(ඇ)	ගොවිජන සේවා කාරක සභා 26 කට අදාළව වර්ෂ 05 සිට වර්ෂ 26 ක කාලපරිච්ඡේදයක් තුළ ඉදිරියට ගෙන එමින් පවතින රු.282,143,854 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	ඇතැම් ශේෂ සඳහා තොරතුරු නොමැති අතර සොයාගත හැකි ශේෂ ඉදිරියේ දී පියවීමට කටයුතු කරමි.	ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.
(ඈ)	මහඔය ගොවිජන සේවා කාරක සභාව සතු රු.685,645 ක ශේෂයක් සහිත ඉතිරි කිරීමේ ගිණුම් දෙකක වර්ෂ 02 සිට වර්ෂ 03 දක්වා කාලයක සිට කිසිදු ගනුදෙනුවක් සිදුව නොමැති බව නිරීක්ෂණය වූ අතර එම ඉතිරි කිරීමේ ගිණුම්වල අවශ්‍යතාවයක් නොමැති නම් ඒවායේ පවතින මුදල් ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර පොලී ආදායමක් උපයා ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.	මෙම මුදල් ජංගම ගිණුමේ නොතබා ඉතිරි කිරිම ගිණුමේ තබා ඇත්තේ පොලී ලැබෙන නිසාය. ඉදිරියේදී ස්ථාවර තැම්පතුවක තැම්පත් කිරීමට කටයුතු කරමි.	විධිමත් අනුමැතිය යටතේ උපරිම පොලී ආදායමක් ලැබෙන පරිදි තැන්පතුවක ආයෝජනය කිරීමට කටයුතු කළ යුතුය.
(ඉ)	මහඔය ගොවිජන සේවා කාරක සභාව සතු රු.3,805,000 ක් වටිනා ස්ථාවර තැන්පතු 04 කට අදාළව එක් එක් ස්ථාවර තැන්පතුවේ වටිනාකම සහ පොලී ආදායම සටහන් කිරීම සඳහා විධිමත් ලේඛනයක් භාවිතා කර නොතිබුණි.	ඉදිරියේදී ස්ථාවර තැන්පතු ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කරමි.	ස්ථාවර තැන්පතු ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය.
(ඊ)	මහඔය ගොවිජන සේවා කාරක සභාව විසින් ලැබිය යුතු සහ ගෙවිය යුතු ශේෂ ඇතුළත් ණයගැති හා ණයහිමි ලේඛන සකස් කර භාවිතා කර නොතිබුණි.	ඉදිරියේදී ණය ගැති හා ණය හිමි ලේඛනයක් සකස්කර භාවිතා කිරිමට කටයුතු කරමි.	ණය ගැති හා ණය හිමි ලේඛන පවත්වා ගත යුතුය.
(උ)	මහඔය හා දෙහිඅත්තකණ්ඩිය ගොවිජන සේවා කාරක සභා සතු ස්ථාවර වත්කම් ඇතුළත් කර ස්ථාවර වත්කම් ලේඛන සකස් කර භාවිතා කර නොතිබුණු අතර එක් එක් වත්කම් වර්ගීකරණ යටතේ ඇතුළත් වත්කම් අයිතම වෙන්කර උපලේඛන සකස් නොකර එකතු වටිනාකමට ක්ෂය ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම හේතුවෙන් ක්ෂය කර අවසන් වූ වත්කම් හඳුනාගෙන ඉවත් කිරීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය.	ඉදිරියේදී ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කරමි.	ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය.
(ඌ)	වී මිලදී ගැනීමේ වැඩ සටහන යටතේ වී මෝල් හිමියන්ට නිකුත් කළ වී	වී මිලදී ගැනිමේ වැඩසටහන යටතේ වී	අදාළ මුදල් අයකර ගැනීමට කඩිනමින්

	වෙනුවෙන් 2013 වර්ෂයේ සිට උහන ගොවිජන සේවා කාරක සභාවට අය විය යුතු රු.1,408,825 ක වටිනාකම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	මෝල් හිමියන්ට නිකුත් කළ වී වෙනුවෙන් 2013 වර්ෂයේ සිට අයවිය යුතු රු.1,408,825 ක මුදල අයකර ගැනිමට කටයුතු නොකිරිම සම්බන්ධයෙන් මේ වන විට නඩු කටයුත්තක් පැවැත්වෙන අතර එමඟින් එම මුදල් අයකර ගැනිමට කටයුතු කරන බව දන්වා සිටිමි.	ක්‍රියාමාර්ග ගත යුතුය.
(එ)	උහන ගොවිජන සේවා කාරක සභාව විසින් 2011 වර්ෂයේ සිට 2015 දක්වා කාලපරිච්ඡේදය තුළ මිලදීගන්නා ලද රු.199,675 ක් වටිනා කෘෂි රසායන තොගයක් හා 2004 වර්ෂයේ දී මිලදීගන්නා ලද රු.76,977 ක් වටිනා පොල් පොහොර තොගයක් කල් ඉකුත් වී තිබුණ ද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් එම තොග අපහරණය කිරීමක් හෝ වෙනත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	සාමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.83,445 ක් වූ කල් ඉකුත් වු කෘෂි රසායන තොගය හා රු.76,977 ක් වූ පොල් පොහොර තොගය අපහරණ කමිටුවක් මඟින් පරික්ෂා කර බලා අපහරණය කිරිමේ ඉදිරි කටයුතු සඳහා ප්‍රධාන කාර්යාලය වෙත යවා ඇත.	අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය.
(ඒ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 20 කට ආසන්න කාලයක් ගතව ඇති 2003 වර්ෂයේ ගොවි බැංකු ණය ගැති ශේෂ ලැයිස්තුවේ දක්වා ඇති චක්‍රීය ණය රු.445,802 ක් හා අත ඉතිරි මුදල් ඌනය ලෙස දක්වා තිබූ රු.93,035 ක් නිරවුල් කිරීමට නාමල්තලාව ගොවිජන සේවා කාරක සභාව විසින් අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.	පිළිතුරු සපයා නොමැත.	ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය.
(ඔ)	පල්ලන්ඔය ගොවිජන සේවා කාරක සභාවේ හිටපු ලිපිකරුවෙකුගෙන් අය විය යුතු රු.500,226 ක වටිනාකමක් 2011 වර්ෂයේ සිට ගිණුම් වාර්තාවල සඳහන් වුවද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විටත් එම මුදල අයකර ගැනීමට කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	පිළිතුරු සපයා නොමැත.	අදාළ මුදල් අයකර ගැනීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඕ)	2018 හා 2019 වර්ෂයන්හි දී සීමා සහිත ලංකා පොහොර සමාගම විසින් ගොවිජන සේවා කාරක සභා 14 ක් වෙත ලබා දී ඇති රු.14,7693,573 ක් වටිනා සංස්ථා නැමැති දියර පොහොර තොගය	මෙම තොග ඉවත්කර ගන්නා ලෙස අදාළ පොහොර සමාගම් දැනුවත් කර ඇත. ඉදිරියේදී අපහරණය	කල් ඉකුත් වූ පොහොර බැහැර කිරීමට හා පාඩුවක් සිදු වී ඇත්නම් ඒ පිළිබඳ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට පියවර ගත

	කල් ඉකුත්ව තිබූ අතර ඒවා සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන කාරක සභා තුළ රඳවාගෙන තිබුණි.	කිරීමට කටයුතු කරමි.	යුතුය.
(ක)	මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් රු.1,634,691 ක් වටිනා කල් ඉකුත් වූ හා හානි වූ තොග ශේෂ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන අදාල ආයතනවලට භාර දීම හෝ ලේඛනවලින් ඉවත් කිරීම සඳහා දෙහිඅත්තකණ්ඩිය ගොවිජන සේවා කාරක සභාව විසින් කටයුතු කර නොතිබුණි.	කල් ඉකුත් වූ එළවලු බීජ, මැරුණු පැළ, යල් පිනූ බීජ, යල් පිනූ කෘෂිරසායන සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා ඇති අතර එහි වාර්තා මේ වන තෙක් ලැබී නොමැත. වාර්තා ලැබුණු පසු ඒ අනුව කටයුතු කරමි.	අදාල ආයතනය වෙත නැවත භාරදීම හෝ විධිමත්ව ඉවත් කිරීම සඳහා ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය.
(ග)	ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්ගේ (ආ.සං.) 2006 ජුනි 14 දිනැති අංක 7/5/6/වි.වි./අ.බ දරන ලිපියේ අංක 4 ඡේදය අනුව ගොවිජන සේවා කාරක සභා 03කට අදාළව වාර්ෂිකව අයකරන අක්කර බදු මුදල් වර්ෂයේ මාර්තු 31 වැනි දින වන විට අයකර ගැනීම අවසන් කර තිබිය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පසුගිය වර්ෂවලට අදාළව රු.3,452,001 ක අක්කර බදු වටිනාකමක් අයකර ගත යුතුව පැවතුණි.	2024 වර්ෂයේ නිවැරදි කරමි.	පසුගිය වර්ෂවලට අදාළව අයකර ගත යුතුව පවතින අක්කර බදු වටිනාකම අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.
(ච)	2022 වර්ෂයේ දී බයෝ ෆුඩ්ස් පෞද්ගලික සමාගම විසින් මහඔය ගොවිජන සේවා කාරක සභාව වෙත ලබා දී තිබූ නයිට්‍රෝ ප්ලස් දියර පොහොර ලීටර 7672 ක තොගයක් කල් ඉකුත් වී ඇති අතර එම තොගය නැවත අදාළ සමාගම වෙත භාරදීම සඳහා කටයුතු කර නොතිබුණි.	බයෝ ෆුඩ්ස් සමාගම මේ සම්බන්ධයෙන් දැනුවත් කර ඇති අතර, ඉදිරියේ දී අපහරණය කිරීමට කටයුතු කරමි.	කල් ඉකුත් වූ තොග අදාළ සමාගම් වෙත නැවත භාරදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය.
(ඡ)	ගොවිජන සේවා කාරක සභා 15 ක් විසින් ගොවිජන සේවා කාරක සභාව සහ ගොවිජන බැංකු සඳහා මෘදුකාංග මිලදීගැනීම වෙනුවෙන් ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් කාර්යාලයට රු.256,965 ක මුදලක් ගෙවා තිබුණ ද එම මෘදුකාංග ලබාගෙන භාවිතයට ගෙන නොතිබුණි.	ඉදිරියේ දී භාවිතයට ගැනීමට නියමිත බව දන්වමි.	මෘදුකාංගය ලබාගෙන භාවිතයට ගත යුතුය.
(ට)	හිඟුරාණ ගොවිජන සේවා කාරක සභාවේ හිටපු ගොවිජන සංවර්ධන නිලධාරියෙකුගෙන් අය විය යුතු ලෙස	2013 වර්ෂයේ සිට ගිණුම් වාර්තාවල ඉදිරියට එන රු.240,470 ක මුදල අය	අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය.

	2013 වර්ෂයේ සිට ගිණුම් වාර්තාවල ඉදිරියට ගෙන එමින් පවතින රු.240,470 ක මුදල අය කිරීමට අදාළව කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත.	කිරීම සඳහා මේ වන විට මූලික විමර්ෂණයක් ආරම්භ කොට ඇත.	
(ඩ)	2017 වර්ෂයේදී සම්මන්තුර පොලිසිය භාරයේ තිබූ පොහොර මිටි 235 ක් මල්වත්ත ගොවිජන සේවා කාරක සභාව වෙත ලබා දී තිබුණද සමාලෝචිත වර්ෂයේ අවසාන වන විටත් එම පොහොර තොගය කාරක සභාව තුළ ගබඩා කර තිබූ අතර ඒ සම්බන්ධයෙන් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	මෙම පොහොර තොගය ගබඩාවෙන් ඉවත් කිරීමට අවශ්‍ය අනුමැතිය ඉල්ලමින් ගොවිජන සේවා නියෝජ්‍ය කොමසාරිස් වෙත ලිපි යවා ඇත.	කල් ඉකුත් වූ තොග ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදුකළ යුතුය.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණ	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
පල්ලන්ඔය ගොවිජන සේවා කාරක සභාවට අයත් මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණය අක්කර 5,268 ක් වුවද, කුඹුරු ඉඩම් නාම ලේඛනයට අක්කර 3,364 ක් පමණක් ඇතුළත් කර තිබුණි.	පිළිතුරු සපයා නොමැත.	මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණය කුඹුරු ඉඩම් නාම ලේඛනයට ඇතුළත් කළ යුතුය.

3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණ	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2021 වර්ෂයේ දී ගොවිජන සේවා කාරක සභා 03 ක් වෙත ලැබී තිබූ රු.10,000,000 ක වටිනාකමකින් යුතු ගොයම් පැළ සිටුවීමේ යන්ත්‍ර 10 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් වර්ෂ 03 ක පමණ කාලයක් ප්‍රයෝජනයට නොගෙන ගබඩාවේ තබා තිබුණි.	ලෝක බැංකු ආධාර යටතේ ලැබුණු පැල සිටුවීමේ යන්ත්‍ර යොදාගෙන 2023/24 මහ කන්නය තුල ආදර්ශ වී වගාවක් ගොවිජන සේවා කාරක සභාව විසින් සිදු කරන ලද අතර, එහිදී එම පැල සිටුවීමේ යන්ත්‍ර වල පැල සිටුවීමේ පරතරය වැඩි නිසාවෙන් එමගින් වගා කටයුතු සිදු කිරීම පාඩු බව හඳුනා ගන්නා ලදී. එම පැල අතර පරතරය වැඩි බැවින් එම යන්ත්‍ර යොදාගෙන වගා කිරිමට ප්‍රදේශයේ ගොවින් මැලි කමක් දන්වන බව කාරුණිකව දන්වා සිටිමි.	එම යන්ත්‍ර අදාළ කාර්යය සඳහා ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

(ආ)	දෙහිඅත්තකණ්ඩිය ගොවිජන සේවා කාරක සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ 17 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට වසර 02 සිට වසර 05 කට අධික කාලයක සිට භාවිතා නොකර පවතින බව නිරීක්ෂණය විය. එයින් භාවිතා කළ නොහැකි වාහන හා යන්ත්‍රෝපකරණ අපහරණය කිරීමටත් අලුත්වැඩියා කළ හැකි වාහන හා යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා කර භාවිතා කිරීමටත් කාරක සභාවේ අවධානය යොමුව නොතිබුණි.	මෙම යන්ත්‍රෝපකරණ වෙන්දේසි කිරීමට සුදුසු බවට භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් නිර්දේශ කර තිබුණද මේ වන තෙක් අවසර ලැබී නොමැත.	වත්කම් අලුත්වැඩියා කර භාවිතා කිරීමට හෝ එසේ නොහැකි නම් විධිමත් පරිදි අපහරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඇ)	ගොවිජන සේවා කාරක සභා 03ක් වෙත දිස්ත්‍රික් කාර්යාලය විසින් 2004 වර්ෂය තුළ දී ලබා දී තිබුණු වතුර මෝටර් 19 ක් දීර්ඝ කාලයක සිට භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි.	වෙන්දේසි කිරීමට ඉල්ලුම් කර ඇත.	වත්කම් නිසි පරිදි උපයෝජනය කිරීමට හෝ එසේ නොහැකි නම් විධිමත් පරිදි අපහරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඈ)	මල්වත්ත ගොවිජන සේවා කාරක සභාව සතු රු.647,000 ක් වටිනා අත් ට්‍රැක්ටර් 04 ක් වසර 05කට වැඩි කාලයක සිට භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි.	අත් ට්‍රැක්ටර් 04 වෙන්දේසි කිරීමට ඉල්ලුම් කර ඇත.	- එම -
(ඉ)	ගොවිජන සේවා කාරක සභා 15 ක් සතු කොම්පෝස්ට් කැබලි කිරීමේ යන්ත්‍ර 15 ක් භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි.	අදාළ ආයතනය වෙත භාරදීමට කටයුතු කරමින් පවතී.	- එම-

3.5 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණ	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ගොවිජන සේවා කාරක සභා 13ක ගොවිජන සංවර්ධන නිලධාරි තනතුරු 13ක පුරප්පාඩු පැවතුණි.	මෙම පුරප්පාඩු ඉදිරියේ දී සම්පූර්ණ කර ගැනීමට කටයුතු කරමි.	පුරප්පාඩු සම්පූර්ණ කරගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	සංවර්ධන නිලධාරී තනතුර සඳහා ගොවිජන සේවා කාරක සභා 14 ක නිලධාරීන් 34 දෙනෙකු හා දිස්ත්‍රික් කාර්යාලයේ නිලධාරීන් 03 දෙනෙකු වශයෙන් නිලධාරීන් 37 දෙනෙකුගේ පුරප්පාඩු පවතින අතර අනෙකුත් කාරක සභාවල නිලධාරීන් 30 දෙනෙකු අතිරික්තව පැවතුණි.	අතිරික්ත ලෙස දක්වා ඇති නිලධාරීන් සියලු දෙනා දමිළ මාධ්‍යයේ නිලධාරීන් වන බැවින් පුරප්පාඩු පවතින සිංහල මාධ්‍ය ගොවිජන සේවා කාරක සභාවල රාජකාරී සඳහා අනුයුක්ත කිරීමේ හැකියාවක් නොමැත.	පුරප්පාඩු සම්පූර්ණ කරගැනීමට හා අතිරික්ත නිලධාරීන් වෙනත් ආයතනවලට අනුයුක්ත කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	ගොවිජන සේවා කාරක සභා 29ට අදාළව ගොවිජන සංවර්ධන නිලධාරි හා සංවර්ධන නිලධාරී තනතුරු හැර තනතුරු කාණ්ඩ 04 ක් සඳහා නිලධාරීන් 07 දෙනෙකුගේ අතිරික්තයක් හා නිලධාරීන් 118 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි.	එම තනතුරු වලට අදාළ බඳවා ගැනීම් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් සිදුකරනු ලබන බැවින් දෙපාර්තමේන්තුව මඟින් නැවත එම තනතුරු වලට නිලධාරීන් බඳවා ගන්නා අවස්ථාවක මෙම පුරප්පාඩු සම්පූර්ණ කරවා ගැනීමට කටයුතු කරමි.	සේවක මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමටත් අතිරික්ත සේවක සංඛ්‍යාව අනුමත කර ගැනීමට හෝ මාරු කිරීමට කටයුතු කළ යුතුය.
(ඈ)	ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලයේ අනුමත සේවක මණ්ඩලය අනුව සංවර්ධන නිලධාරී තනතුර හැර වෙනත් තනතුරු 04 ක් සම්බන්ධයෙන් නිලධාරීන් 06 දෙනෙකුගේ පුරප්පාඩු පැවැතුණි.	මෙම තනතුරු පුරප්පාඩු සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත දන්වා යවා ඇත.	සේවක මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුය.

4. ගොවිජන බැංකු

	විගණන නිරීක්ෂණ	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2012 පෙබරවාරි 29 දිනැති අංක 2012/04 දරන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ අංක 1.6 වගන්තිය ප්‍රකාරව ග්‍රාමීය ගොවි ජනතාවගේ ජීවන මට්ටම දියුණු කිරීම උදෙසා සෑම ගොවිජන සේවා කාරක සභාවක්ම ගොවි බැංකු ක්‍රමවත්ව පවත්වා ගත යුතු වුවද ගොවිජන සේවා	ඉදිරියේ දී සක්‍රීය තත්ත්වයට පත්කර ගැනීමට කටයුතු කරමු.	චක්‍රලේඛය ප්‍රකාරව ගොවීන් වෙත සහන සැලසීම සඳහා ණය ලබාදීමට ගොවි බැංකුව ක්‍රියාත්මක මට්ටමට ගැනීමට කටයුතු කළ යුතුය.

	කාරක සභා 11 ක් විසින් 2009 වර්ෂයෙන් පසු ගොවි ජනතාවගෙන් තැන්පතු මුදල් එක්රැස් කළ ද ණය ලබාදීමක් සිදුකර නොතිබුණි.		
(ආ)	ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයාගේ 2012 පෙබරවාරි 29 දිනැති අංක 2012/04 දරන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ අංක 2.6.2 (vii) ඡේදය අනුව කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් විසින් වසමේ ගොවීන් වෙත නිකුත් කර ඇති ණය කලට වේලාවට අයකර ගැනීමට කටයුතු කළ යුතු වුවද, එසේ කටයුතු නොකිරීම නිසා ගොවිජන සේවා මධ්‍යස්ථාන 19 කට අදාළව 1999 යල කන්නයේ සිට 2023 යල කන්නය දක්වා රු.25,170,644 ක කල් පසු වූ ණය හා පොලී මුදලක් අයකර ගෙන නොතිබුණි.	හිඟ ණය ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි.	කල්පසු වූ ණය අයකර ගැනීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඇ)	මධ්‍යම කඳවුර ගොවිජන බැංකුව විසින් 2003 වර්ෂයේ සිට 2005 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ ගොවීන්ගෙන් ණය අයකර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව අදාළ නිලධාරීන්ගෙන් අයකර ගත යුතුව තිබූ මුදලින් රු.261,228 ක මුදලක් 2024 ජුනි 18 විගණිත දින වන විටත් අයකර ගෙන නොතිබුණි.	මේ පිළිබඳ ප්‍රධාන කාර්යාලය දැනුවත් කර ඇත.	විධිමත් පරීක්ෂාවක් සිදුකර වගකිව යුතු නිලධාරීන්ගෙන් අදාළ මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය.
(ඈ)	2004 වර්ෂයේ උහන ගොවිජන සේවා කාරක සභාවේ මධ්‍යස්ථාන කළමනාකරු ලෙස සේවය කළ මේ වන විට විශ්‍රාම ගොස් සිටින නිලධාරිණියකගෙන් වසර 20 ක පමණ කාලයක සිට අයකර ගත යුතු රු.106,247 ක මුදල අයකර ගැනීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	2004 වර්ෂයේ හිටපු මධ්‍යස්ථාන කළමණාකරු ලෙස සේවය කළ ආර්.රංජනි පෙරේරා මහත්මියගෙන් අය විය යුතු අත ඉතිරි මුදල වන රු.106,247 ක මුදල අයකර ලබාදෙන ලෙස 2024 වර්ෂයේ ගො.සං නියෝජ්‍ය කොමසාරිස් වෙත ලිපියක් මඟින් දැනුම් දෙන ලදී.	හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඉ)	මායාදුන්න ගොවිජන සේවා කාරක සභාවේ හිටපු කාරක සභා ලිපිකරුවෙකුගෙන් අයකර ගත යුතු රු.39,834 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි.	අදාළ මුදල් අයකර ගැනීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඊ)	මායාදුන්න ගොවිජන සේවා කාරක සභාවේ සිතමු ව්‍යවසායක ණය වැඩසටහන යටතේ එයට සම්බන්ධ සාමාජිකයින් දෙදෙනෙකුගෙන් අයකර	ණය වැඩසටහනට සම්බන්ධ වී ඇති සාමාජිකාවන්ගෙන් අය කර ගැනීමට මේ වන විට සිහි කැඳවීම් ලිපි යවා ඇත.	අදාළ සාමාජිකයින්ගෙන් මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින්

	ගත යුතු පොලිය සමඟ ණය මුදල වන රු.112,360 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.		ගත යුතුය.
(උ)	මහඔය ගොවිජන බැංකුවේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 10 කට අධික කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන එමින් පවතින රු.634,308 ක් වටිනා ලැබිය යුතු චක්‍රීය ණය ශේෂය සහ රු.599,527 ක් වටිනා ගෙවිය යුතු චක්‍රීය අරමුදල් ශේෂය නිරවුල් කිරීම සඳහා කටයුතු කර නොතිබුණි.	චක්‍රීය ණය කපා හැරීමට ප්‍රධාන කාර්යාලයෙන් ඉල්ලුම් කර ඇත.	චක්‍රීය අරමුදල් ණයශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය.
(ඌ)	මහඔය ගොවිජන බැංකුවේ කොටස්, තැන්පත්, කණ්ඩායම් තැන්පත් හා ගොවි සංවිධාන තැන්පත් සම්බන්ධයෙන් පරිගණක ගත තොරතුරු පද්ධතියට සාපේක්ෂව කොටස් හා තැන්පත් ලෙජර් යාවත්කාලීනව පවත්වා නොතිබුණු අතර විගණිත දින වන විට එම තොරතුරු ඇතුළත් පරිගණකය ක්‍රියා විරහිත වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ පොලී ගණනය කිරීම් ඇතුළුව කොටස් හා තැන්පතු ශේෂවල නිරවද්‍යතාවය තහවුරු කරගත නොහැකි විය.	ඉදිරියේදී කොටස් හා තැන්පතු ලෙජරය නිවැරදිව පවත්වාගෙන යාමට කටයුතු කරමි.	පරිගණක ගත තොරතුරු පද්ධතියට සාපේක්ෂව කොටස් හා තැන්පතු ලෙජරය නිවැරදිව පවත්වා ගත යුතුය.
(එ)	නාමල්තලාව ගොවිජන සේවා කාරක සභාව වෙත ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2021 ඔක්තෝම්බර් 27 දිනැති හා අංක 2021/16 දරන චක්‍රලේඛය අනුව කල් පසු වූ ණය සඳහා පොලී ගණනය කිරීම්, ගිණුම්ගත කිරීම් හා අය කිරීමට අදාළව කටයුතු කර නොතිබුණි.	පිළිතුරු සපයා නොමැත.	චක්‍රලේඛය ප්‍රකාරව ණය සඳහා පොලී ගණනය කිරීම්, ගිණුම්ගත කිරීම් හා අය කිරීමට අදාළව විධිමත්ව කටයුතු කළ යුතුය.
(ඒ)	නාමල්තලාව ගොවි බැංකුව විසින් 2003/2004 මහ කන්නයේ සිට 2004/2005 මහ කන්නය දක්වා නාමල්තලාව ගොවිජන සේවා මධ්‍යස්ථානයේ සේවයේ නියුතු කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරවරයෙකු වෙත වී සුරැකුම් ණය නිකුත් කර තිබූ අතර එම නිලධාරියාගෙන් හිඟ ණය හා පොලිය රු.97,500 ක් අයකර ගැනීමට 2024 ජූලි 26 දින වන විටත් ගොවිජන සංවර්ධන නිලධාරි විසින් පියවර ගෙන නොතිබුණි.	පිළිතුරු සපයා නොමැත.	විධිමත් පරීක්ෂාවක් සිදුකර වගකිව යුතු නිලධාරීන්ගෙන් අදාළ මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය.